# අකුරැස්ස-පිටබැද්දර පාලමේ සිරවූ අපද්‍රව්‍ය නාවික හමුදාවෙන් ඉවතට

## ගංවතුර අවදානම පහව යයි

(ඉන්දිකා රාමනායක)

ජලය බැස යාමට බාධා එල්ල කරමින් මාතර අකුරැස්ස පිටබැද්දර පාලමේ සිරවී තිබූ අපද්‍රව්‍ය හා දැව කඳන් නාවික හමුදාව පෙරේදා (28) රාත්‍රියේ සිදුකළ මෙහෙයුමකින් ඉවත් කළ බව නාවික හමුදාව කියයි.

මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර සහ සියඹලාගොඩ, රොටුඹ, පස්ගොඩ යා කෙරෙන පිටබැද්දර පාලමේ යට කොටසේ දැව කඳන් ඇතුළු විශාල අපද්‍රව්‍ය තොගයක් සිරවී ඇති බවත් ඒ හේතුවෙන් නිල්වලා ගඟේ ජල මට්ටමේ ඉහළ ගොස් ගංවතුර අවදානමක් පැවැති බව ද නාවික හමුදාව සඳහන් කරයි.

මේ සම්බන්ධයෙන් ලැබුණු තොරතුරු මත නාවික හමුදා විශේෂ යාත්‍රා බලඝනය හා මැරීම් බලසනයේ 71 දෙනකුගේ කණ්ඩායමක් හා කිමිදුම් අංශයේ නාවික භටයින් 6 දෙනෙකු මෙම මෙහෙයුම් සඳහා යොදවා තිබූ බවද නාවික හමුදාව සඳහන් කරයි.



නාවික හමුදාව හට පිරිස් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මෙහෙයුමේ නිරතව වූ අයුරු ඡායාරූයෙන් දැක්වේ
ඡායාරූපය නාවික හමුදාව අනුග්‍රහයෙනි.